# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල වැදගත් කරුණු:

## අප්‍රේල් මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පහළ යන ලදී.

**පෙර වසරවල පැවති රටාවට අනුගත වෙමින් නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 අප්‍රේල් මාසයේදී 44.3 දක්වා මාර්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 22.7 කින් පහළ යන ලදී.** මාර්තු මාසයේදී වාර්තා කළ ඉහළ අගයන්ට සාපේක්ෂව නිෂ්පාදන, නව ඇණවුම්, තොග මිලදී ගැනුම් සහ සේවා නියුක්තිය උප දර්ශක වල සිදුවූ සැලකිය යුතු පහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සව සමයේ පැවති ඉහළ ඉල්ලුම සමනය වීමත් සමගම, විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ නව ඇණවුම් සැලකිය යුතු ලෙස පහළ යන ලදී. මේ අතර, අලුත් අවුරුදු නිවාඩුවෙන් පසු අනුමැතියෙන් තොර නොපැමිණීම් ඉහළ යාම නිසා සේවා නියුක්තිය පහත වැටීම මෙන්ම අප්‍රේල් මාසයේ වැඩ කරන දින ගණන අඩු වීම හේතුවෙන්, විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශවල නිෂ්පාදනය සැලකිය යුතු ලෙස පහළ යන ලදී. තවද, අප්‍රේල් මස අග භාගයේදී කෝවිඩ්-19 වසංගතය නැවත පැතිරීම නිසා සේවකයින් සේවා ස්ථාන වෙත වාර්තා කිරීම සම්බන්ධ භාධා ඇතිවූ අතර සමහර සේවා යෝජකයින් ඔවුන්ගේ සමස්ත ශ්‍රම බලකාය සේවයේ යෙදවීමෙන් ද වැළකී සිටියහ.

| විචල්‍යය | මාර්තු | අප්‍රේල් | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **67.0** | **44.3** | **-** | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 73.9 | 44.3 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිෂ්පාදන | 72.9 | 33.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 56.4 | 44.9 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 72.3 | 40.9 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 53.7 | 64.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මේ අතර, නව ඇණවුම් සහ නිෂ්පාදනය පහත වැටීම මෙන්ම අවිනිශ්චිතතාව ඉහළ යාමත් සමඟ තොග මිලදී ගැනුම් උප දර්ශකයද පහළ යන ලදී. පැවති ඉහළ ඉල්ලුම අවසාන වීමත් සමගම සිය තොග මිලදී ගැනීම් අඩු කළ බව විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ බොහෝ ප්‍රතිචාර දක්වන්නන් අවධාරණය කරන ලදී.

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය 2021අප්‍රේල් මාසය තුළ වැඩි වේගයකින් ඉහළ ගිය අතර ආනයනයේදී හා දේශීය සැපයුම් ජාලයන්ගේ සිදුවූ ප්‍රමාදයන් මේ කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, බොහෝ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළ පරිදි නැව් භාණ්ඩ ප්‍රවාහන ගාස්තු තවදුරටත් ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් ආනයනික අමුද්‍රව්‍යවල පිරිවැය ඉහළ යාම ඔවුන්ගේ ලාභාන්තිකයට අහිතකර ලෙස බලපා ඇත.


නිෂ්පාදකයින් සඳහන් කළ පරිදි, COVID-19 වසංගතයේ තුන්වන රැල්ල සමඟ ඇතිවූ අවිනිශ්චිතතාවය රටේ නිෂ්පාදන කර්මාන්ත කටයුතුවලට බාධාවක් විය හැකිය. එබැවින්, පෙර මාසයට සාපේක්ෂව ඉදිරි මාස තුන සඳහා නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සමස්ත අපේක්ෂාවන් සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇත.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**44.3**

**2021 මාර්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 22.7ක පහළ යෑමකි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2021 මාර්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.8 කින් ඉහළ යමින් 2021 අප්‍රේල් මාසයේදී 55.8ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2021 අප්‍රේල් මාසයේදී එක්සත් රාජධානිය, යුරෝපා කලාපය, ඉන්දියාව, චීනය සහ එක්සත් ජනපදයෙ හි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වැඩි වේගයකින් ඉහළ ගිය අතර, රුසියාවේ එම දර්ශකය අඩු වේගයකින් ඉහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2021 මැයි 16 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**අඛණ්ඩව මාස හතරක් පුරා සේවා අංශය වර්ධනයක් පෙන්නුම් කළ ද, සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 අප්‍රේල් මාසයේ දී දර්ශකාංක 48.9ක් දක්වා පහළ ගියේය.** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්ති සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි දක්නට ලැබුණු පහළ යෑම් හේතු විය.

ප්‍රධාන වශයෙන්, ප්‍රවාහන, අධ්‍යාපන සහ රක්ෂණ යන උපඅංශවල දක්නට ලැබුණු පහළ යෑම් සමඟ සේවා අංශයේ නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම් 2021 අප්‍රේල් මාසයේ දී පහළ ගියේය. මීට අමතරව, අනෙකුත් පෞද්ගලික සේවා උප අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම්වලද පහළ යෑමක් සිදු විය. සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මෙම පහළ යෑම සඳහා අප්‍රේල් මාසයේ පවතින වැඩි නිවාඩු ප්‍රමාණය මෙන්ම, මාසයේ අග භාගයේ සිදු වූ COVID-19 වසංගතයේ තෙවන රැල්ලේ ආරම්භය ද හේතු විය. එසේ වුවද, සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සව සමයේ භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් නවාතැන් හා ආහාරපාන සැපයීම සහ තොග හා සිල්ලර වෙළඳාම උප අංශවල 2021 අප්‍රේල් මාසයේ දී වර්ධනයක් දක්නට ලැබුණි.

විශ්‍රාම යෑම් මධ්‍යයේ නව බඳවා ගැනීම් සිදු නොකිරීම හේතුවෙන් සේවා නියුක්තිය 2021 අප්‍රේල් මාසයේ දී පහළ ගියේය.

අඛණ්ඩව මාස දෙකක් පහළ යෑමෙන් අනතුරුව, COVID-19 රෝගීන්ගේ ඉහළ යෑම මධ්‍යයේ ප්‍රාදේශීයව පැනවූ හුදකලා කිරීම් සහ සේවා මුර ක්‍රම ක්‍රියාත්මක කිරීම හේතුවෙන් නිමකිරීමට නියමිත කාර්යයන් 2021 අප්‍රේල් මාසයේ දී ඉහළ ගියේය.

| විචල්‍යය | මාර්තු | අප්‍රේල් | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **62.1** | **48.9** | **-** | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 64.7 | 48.9 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 73.4 | 47.9 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 52.2 | 48.4 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 49.4 | 54.4 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 70.7 | 44.7 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අඛණ්ඩව මාස පහක් පුරා ඉහළ යෑමෙන් අනතුරුව, COVID-19 වසංගතයේ තෙවන රැල්ල හේතුවෙන් ඇති වූ අයහපත් අපේක්ෂා හමුවේ 2021 අප්‍රේල් මාසයේ දී ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර කටයුතු පිළිබඳ අපේක්ෂා ද පහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**48.9**

**2021 මාර්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 13.2ක පහළ යෑමකි.**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි තවදුරටත් ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 මාර්තු මාසයේ පැවති 54.7 සිට 2021 අප්‍රේල් මාසයේ දී 56.6 දක්වා ඉහළ ගියේය.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය, එක්සත් රාජධානිය සහ ඉන්දියාව යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2021 අප්‍රේල් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ජපානයේ එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2021 මැයි 16 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.